**වැදගත්!**

ඔබ විසින් සෙලාන් බැංකු වීසා/ මාස්ටර් කාඩ්පත් භාවිත කිරීමට පෙර, කරුණාකර මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම කියවන්න. මෙම නීතිරීති හා කොන්දේසි තුළ 'කාඩ්පත' යන යෙදුම මගින් පහත දැක්වෙන සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හෝ ඒවායෙහි ඕනෑම සම්මිශ්‍රණයක් අදහස් වේ:

- සෙලාන් වීසා/ ප්ලැටිනම්/ගෝල්ඩ්/ ක්ලැසික්
- සෙලාන් මාස්ටර් ටයිටේනියම්/ගෝල්ඩ්/ක්ලැසික්

මෙම කාඩ්පත් භාවිත කිරීම මගින් පහත දක්වා ඇති නීතිරීති සහ කොන්දේසි ඔබ විසින් පිළිගන්නා අතර, එමගින් ඔබ බැඳී සිටිනු ඇත.

සෙලාන් වීසා/ මාස්ටර්කාඩ් (කාඩ්පත) යන කාඩ්පත් සෙලාන් බැංකුව පී.එල්.සී. විසින් පහත දැක්වෙන නීතිරීති හා කොන්දේසිවලට යටත්ව නිකුත් කෙරෙනු ඇත.

## ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම

ක්‍රෙඩිට් කාඩ්පතක්/පත් නිකුත් කරන ලෙස මම /අපි මෙමගින් සෙලාන් බැංකුව වෙත අයදුම් කර සිටින අතර, මෙම අයදුම්පතෙහි සහ ඇමුණුම්වල (ඇත්නම්) සපයා ඇති තොරතුරු සෑම අතකින් ම සත්‍ය සහ නිවැරදි වන බවට ද තහවුරු කරන අතර, මා/ අප වෙනුවෙන් ගිණුමක් විවෘත කරන ලෙස ද, කාඩ්පත/කාඩ්පත් දෙකට කපා දමා එම කොටස් දෙක ම ඔබ වෙත ආපසු භාරදීම මගින් කාඩ්පත/ කාඩ්පත් භාවිත කිරීමට මාගේ/ අපගේ අයිතීන් මා/අප විසින් අතහරින තෙක් කාඩ්පත/ කාඩ්පත් අලුත් කර, නව කාඩ්පත් නිකුත් කරන ලෙස ද මම/අපි ඔබ වෙතින් ඉල්ලා සිටිමි/සිටිමු.

මා/අප වෙතින් විමසීමකින් තොරව, කලින් කලට මාගේ /අපගේ බැංකුකරුවන් වෙතින් හෝ සුදුසු යැයි සිතන වෙනත් මූලාශ්‍ර වෙතින් ඕනෑම තොරතුරක් තහවුරු කරගැනීමට මම /අපි මෙමගින් සෙලාන් බැංකුව වෙත අවසර දෙමි/දෙමු.

මාගේ/අපගේ ක්‍රෙඩිට් කාඩ්පත/කාඩ්පත් සෙලාන් බැංකුව පී.එල්.සී. විසින් නිකුත් කර ඇති මෙම සෙලාන් බැංකු ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි නීතිරීති සහ කොන්දේසිවලට යටත්ව පමණක් භාවිත කරනු ඇති බවට මම/අපි එකඟ වන අතර, ක්‍රෙඩිට් කාඩ්පත ද සමඟ මා/අප වෙත නිකුත් කරන ලද, මා/අප විසින් නිසි ලෙස කියවා තේරුම් ගෙන ඇති මෙම සෙලාන් බැංකු කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි දැක්වෙන නීතිරීති සහ කොන්දේසි පිළිගැනීමට ද එමගින් බැඳී සිටීමට ද මම/අපි වැඩිදුරටත් එකඟ වෙමි/වෙමු.

විදේශ රටවල දී වාණිජ ප්‍රමාණවලින් භාණ්ඩ මිලදී ගැනීමට සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රාග්ධනය ප්‍රේෂණය කිරීමට ක්‍රෙඩිට් කාඩ්පත භාවිත නොකරන බවට මම/අපි මෙමගින් එකඟ වෙමි/වෙමු.

මා/අප විදේශයකට සංක්‍රමණය වන්නේ නම් හෝ විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම් හෝ මා/අප විසින් ක්‍රෙඩිට් කාඩ්පත/කාඩ්පත් බැංකුව වෙත භාර දී ගෙවිය යුතු හිඟ මුදල් සම්පූර්ණයෙන් ම පියවන බවට ද මම/අපි මෙමගින් එකඟ වෙමි/වෙමු.

(මින් මතුවට මෙහි 'කාඩ්පත් හිමියා' ලෙස හැඳින්වෙන) මාගේ/අපගේ ඉල්ලීම මත මූලික සහ අතිරේක කාඩ්පතින් කෙරෙන අයකිරීම් සඳහා එක් ව හා වෙන් වෙන් ව වගකීමට මම/අපි මෙමගින් එකඟ වන අතර, එකී මුදල් ඉල්ලූ විටෙක ගෙවීමට ද මෙමගින් එකඟ වෙමි/වෙමු.

2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, සහ ඊට අදාළ වන මාර්ගෝපදේශ හා නියමයන් ද, 1988 අංක 30 දරන ශ්‍රී ලංකා බැංකු පනත හා එකී සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති, එම පනත ප්‍රකාරව අතහැර දැමූ දේපල සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ හා නියමයන් ද ඇතුළත් මාර්ගෝපදේශවල අඩංගු ප්‍රතිපාදන සම්බන්ධයෙන් මා/අප දැනුවත්ව සිටින බවට මම/අපි මෙමගින් තහවුරු කර සිටිමි/සිටිමු. ශ්‍රී ලංකාවේ අවසර ලත් වාණිජ බැංකුවල මෙහෙයුම්වලට අදාළ වන ඉහත කී නීති සහ අනෙක් සියලු නීති ද, ඉහත කී නියමයන් හා මාර්ගෝපදේශ මගින් නියම කෙරෙන පරිදි බැංකුව විසින් සෑම අවස්ථාවකදී ම එකී ප්‍රතිපාදනවලට අනුකූලව ක්‍රියා කරනු ඇති බව මම/අපි අවබෝධ කරගෙන ඊට එකඟ වී සිටින බවට මෙමගින් තහවුරු කර සිටිමි/සිටිමු.

කිසිදු ආකාරයක හේතුවක් නොදක්වා සිය පූර්ණ අභිමතය පරිදි මෙම අයදුම්පත පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සෙලාන් බැංකුව පී.එල්.සී. (මින් මතුවට මෙහි 'බැංකුව' යනුවෙන් හැඳින්වේ) වෙත හිමිකම පවතින බවට මම/අපි පිළිගන්නා අතර, මෙහි පහත දක්වා ඇති නීතිරීති හා කොන්දේසි මගින් බැඳී සිටීමට අවලංගු කළ නොහැකි ලෙස මෙමගින් එකඟ වී භාරගෙන සිටිමි/සිටිමු.

**අර්ථ දැක්වීම්**

සන්දර්භය මගින් වෙනත් ආකාරයකට අදහස් නොවන්නේ නම්, මෙම නීතිරීතිවල භාවිත කර ඇති තද පැහැති අකුරු සහිත යෙදුම්වලට පහත දැක්වෙන අර්ථ පවතියි. 'ගිවිසුම' යනුවෙන් අදහස් වන්නේ මෙම ගිවිසුමෙහි නීතිරීතිවලට අනුකූලව කලින් කලට සංශෝධනය කර ඇති පරිදි, මින් මතුවට මෙහි දක්වා ඇති නීතිරීති පද්ධතිය වන අතර, මෙම ගිවිසුමෙහි කොටසක් ලෙස සැලකෙන, කලින් කලට පළ කරනු ලබන සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වන අතිරේක නීතිරීති ද එයට ඇතුළත් වනු ඇත.

**අර්ථනිරූපන**

සන්දර්භය මගින් වෙනත් ආකාරයකට අදහස් නොවන්නේ නම් හෝ වෙනත් ආකාරයකට නිශ්චිත දක්වා නොමැත්තේ නම්:

(a) සිරස්තල යොදා ඇත්තේ පහසුව සඳහා පමණක් වන අතර, මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම අර්ථනිරූපනය කිරීමට එමගින් බලපෑමක් නොමැති වනු ඇත;

(b) 'ඇතුළත්ව' යන වචනය හා ඊට සමාන වචන මගින් කිසිදු සීමා කිරීමක් අදහස් නොවේ;

(c) කාඩ්පත් හිමියා යන යෙදුම මගින් අතිරේක කාඩ්පත් හිමියන් ද අදහස් වන අතර ඔවුන් ද ඊට ඇතුළත් වේ;

(d) කාඩ්පත යන යෙදුම මගින්, සෙලාන් බැංකුව පී.එල්.සී. විසින් නිකුත් කරන ලද ඕනෑම ආකාරයක කාඩ්පත් (සෙලාන් ප්ලැටිනම් වීසා/ ෆ්‍රීඩම් මාස්ටර්කාඩ්/ගෝල්ඩ් වීසා/සෙලාන් ක්ලැසික් වීසා කාඩ්) අදහස් වන අතර, ඒ සියල්ල ඊට ඇතුළත් වන අතර, නිකුත් කරන ලද අතිරේක කාඩ්පත/ කාඩ්පත් ද ඊට ඇතුළත් වේ;

(e) යම් කිසි පාර්ශ්වයක් එක් පුද්ගලයෙකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන්නේ නම්, එම සෑම තැනැත්තෙකුගේ ම වගකීම එක් ව හා වෙන් වෙන් ව පවතිනු ඇත;

(f) ඒකවචන අර්ථ සහිත වචනවලට බහුවචන ද ඇතුළත් වන අතර, එය ම අනෙක් අතට ද සත්‍ය වේ. පුරුෂලිංග අර්ථ සහිත වචනවලට ස්ත්‍රීලිංග වචන ද ඇතුළත් වන අතර එය ම අනෙක් අතට ද සත්‍ය වේ;

(g) මෙම ගිවිසුමෙහි පවතින අර්ථනිරූපනයක් හැඟවෙන යම් වචනයක් හෝ යෙදුමක් එකී අර්ථනිරූපනයට අදාළ අර්ථය දරනු ඇත;

(h) වගන්ති හෝ වෙනත් හඳුනාගැනීමේ සංකේතවලට ඇති යොමු කිරීම් මෙම ගිවිසුමෙහි ම පවතින වගන්ති හෝ වෙනත් හඳුනාගැනීමේ සංකේතවලට ඇති යොමුකිරීම් වේ. කාඩ්පත සක්‍රීය කරන අවස්ථාව වනවිට මෙම ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි සියල්ලට කාඩ්පත් හිමියා එකඟ වී සිටින බවට සැලකෙන බවට මෙමගින් දෙපාර්ශ්වය අතර එකඟ වේ;

(i) 'මුදල්' යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා රජය විසින් හෝ විදේශ රජයක් විසින් නිකුත් කර, ස්ථාපිත කර, අවසර දී ඇති හෝ සම්මත කර ඇති මූල්‍ය හුවමාරු ඒකකයක් හෝ මාධ්‍යයක් වේ;

(j) 'මූල්‍ය වටිනාකම' යන්නෙන්, ගබඩා කළ වටිනාකම්, ගෙවුම් ලේඛන හෝ ගිණුම්වලට බැර ආකාරයෙන් ද ඇතුළත්ව මුදලින් ආපසු ගෙවිය හැකි හෝ නොහැකි හෝ, හුවමාරු මාධ්‍යයක් අදහස් වන අතර, රන් කාසි හෝ සණ රන් ද ඊට ඇතුළත් වේ.

## 1. කාඩ්පත

1.1 කාඩ්පත බැංකුවේ දේපලක් වන අතර, බැංකුව ඉල්ලූ විටෙක කාඩ්පත් හිමියා විසින් වහාම එය බැංකුව වෙත ආපසු භාරදිය යුතු වේ.

1.2 බැංකුව විසින් එහි පූර්ණ අභිමතය පරිදි සහ කිසිදු පූර්ව දැනුම් දීමකින් හා හේතු දැක්වීමකින් තොරව, ඕනෑම අවස්ථාවක කාඩ්පත සහ කාඩ්පත භාවිත කිරීමට කාඩ්පත් හිමියාට ඇති අයිතිය අවලංගු කළ හැකි අතර, කිසියම් කාඩ්පත් ගනුදෙනුවකට අවසර දෙන ලෙස කරන ඕනෑම ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකිය.

## 2. කාඩ්පත භාරදීම සහ භාවිතය

2.1 කාඩ්පත ලැබීමෙන් පසුව කාඩ්පත් හිමියා විසින් වහාම කාඩ්පතෙහි පිටුපස අත්සන් තැබිය යුතු අතර, වෙනත් කිසිම තැනැත්තෙකුට එය භාවිත කිරීමට අවසර නොදිය යුතු අතර, සෑම අවස්ථාවක දී ම කාඩ්පත ආරක්ෂා කරගත යුතු අතර, එය කාඩ්පත් හිමියාගේ පුද්ගලික සන්තකයේ සහ පාලනයේ තබාගත යුතු වේ.

2.2 කාඩ්පත සඳහා ලබා දී ඇති පෞද්ගලික හඳුනාගැනීමේ අංකය (රහස්‍ය අංකය - PIN) සාමාන්‍ය තැපැල මගින් කාඩ්පත් හිමියා වෙත භාරදෙනු ඇත. එය තැපැල් කිරීමෙන් පැය හැත්තෑ දෙකක් තුළ කාඩ්පත් හිමියා වෙත රහස්‍ය අංකය ලැබී එය පිළිගෙන ඇතැයි සැලකෙනු ඇත. රහස්‍ය අංකය ලැබුණු පසුව, එය කාඩ්පත් හිමියාගේ දේපලක් වන අතර, රහස්‍ය අංකය සුරක්ෂිතව පවතින බවට ද කිසිදු ආකාරයකින් එය අන්සතු වී නොමැති බවට ද සහතික වීම සඳහා කාඩ්පත් හිමියා විසින් සියලුම ආරක්ෂක පියවර ගත යුතු ය.

2.3 ලිපිනය වෙනස් කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් ලිඛිතව ඉල්ලීමක් සිදුකළ විටෙක, බැංකුව විසින් කාඩ්පත, ගිණුම් ප්‍රකාශනය, රහස්‍ය අංකය සහ/හෝ කාඩ්පතට අදාළ වෙනත් ඕනෑම ලිපි ගනුදෙනුවක් සම්බන්ධව භාවිත කෙරෙන ලිපිනය ලෙස එම ලිපිනය යොදාගනු ඇත.

2.4 කාඩ්පත සහ රහස්‍ය අංකය යන දෙකම භාවිත කරමින් සිදුකරන ලද සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකීමට යටත් වනු ඇත. කාඩ්පත හෝ රහස්‍ය අංකය ආරක්ෂා නොකිරීම මගින් කාඩ්පත් හිමියා වංචනික ලෙස හෝ නොසැලකිල්ලෙන් යුතුව ක්‍රියාකර ඇත්නම් හෝ, එය නැතිවීම, සොරකම් කිරීම හෝ හෙළිදරව් වීම සම්බන්ධව වහාම බැංකුව වෙත වාර්තා නොකළහොත්, කාඩ්පත් ගිණුමට හර කෙරෙන සියලුම මුදල් ප්‍රමාණ සඳහා කිසිදු සීමාවකින් තොරව කාඩ්පත් හිමියා වගකීමට යටත් වනු ඇත. බැංකුව විසින් කලින් කලට යම්

සන්නිවේදන ක්‍රමයක් මගින් කාඩ්පත් හිමියා වෙත නිර්දේශ කර ඇති ආකාරයට කාඩ්පත හෝ රහස්‍ය අංකය ආරක්ෂා කරගැනීමට සහ/හෝ සුරක්ෂිත කරගැනීමට ගත යුතු පියවර අනුගමනය කිරීමට අපොහොසත් වීම ඉහත කරුණ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියාගේ පාර්ශ්වයෙන් සිදුවන දැඩි නොසැලකිල්ලක් ලෙස සැලකෙනු ඇත.

2.5 කාඩ්පත සම්බන්ධයෙන් බැංකුව විසින් (මින් මතුවට මෙහි ඇතැම් තැනෙක 'කාඩ්පත් ගිණුම' යනුවෙන් හැඳින්වෙනු ඇති) ගිණුමක් පවත්වාගෙන යනු ඇති අතර, කාඩ්පත භාවිත කරමින් සිදුකරන ලද සියලුම භාණ්ඩ, සේවා මිලදී ගැනීම්වල සහ මුදල් අත්තිකාරම්වල ('කාඩ්පත් ගනුදෙනු') වටිනාකම සහ වෙනත් සියලුම ගාස්තු සහ අයකිරීම් එයට හර කෙරෙනු ඇත. කිසියම් අලෙවි හෝ මුදල් අත්තිකාරම් වවුචරයක් අත්සන් කිරීමට කාඩ්පත් හිමියා අපොහොසත් වීම, ඒ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා බැංකුව වෙත පවතින වගකීමෙන් නිදහස් වීමට හේතුවක් නොවේ.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ගනුදෙනු සම්බන්ධයෙන්, බැංකුවේ පරිගණක පද්ධතියේ පවතින තොරතුරු සහ/හෝ වාර්තා එම ගනුදෙනුවලට කාඩ්පත් හිමියා විසින් අවසර දී ඇති බවට අවසානාත්මක සාක්ෂියක් වේ.

කාඩ්පත් හිමියා විසින් හෝ තෙවන පාර්ශ්වයක් විසින් හෝ අදාළ ගනුදෙනුව/ගනුදෙනු සිදුකර ඇති බවට විශ්වාස කිරීමට බැංකුවට හේතු පවතින්නේ නම්, මතභේදයට ලක්ව ඇති යම් ගනුදෙනුවක වටිනාකම කාඩ්පත් හිමියා වෙතින් අය කරගැනීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

2.6 රහස්‍ය අංකය යොදා ගැනෙන ගනුදෙනුවක් සම්බන්ධයෙන් (උදා: රහස්‍ය අංකය යොදා ගැනෙන ස්වංක්‍රීය ගනුදෙනු, ටෙලර් යන්ත්‍ර/දුරකථන බැංකු සේවා/අන්තර්ජාල බැංකු සේවා) බැංකුවේ පරිගණක පද්ධතියේ පවතින තොරතුරු සහ/හෝ වාර්තා එම ගනුදෙනුවලට කාඩ්පත් හිමියා විසින් අවසර දී ඇති බවට අවසානාත්මක සාක්ෂියක් වන බවට කාඩ්පත් හිමියා මෙමගින් අවබෝධ කරගෙන එකඟ වී සිටියි.

2.7 කාඩ්පත් හිමියා විසින් හෝ තෙවන පාර්ශ්වයක් විසින් හෝ අදාළ ගනුදෙනුව/ගනුදෙනු සිදුකර ඇති බවට විශ්වාස කිරීමට බැංකුවට හේතු පවතින්නේ නම්, මතභේදයට ලක්ව ඇති යම් ගනුදෙනුවක වටිනාකම කාඩ්පත් හිමියා වෙතින් අය කරගැනීමේ අයිතිය බැංකුව විසින් රඳවා ගනියි.

2.8 යම් දිනයක කාඩ්පත් ගිණුම සීමාව ඉක්මවා ඇත්නම් හෝ එම ගනුදෙනුව/ගනුදෙනු සැක කටයුතු බවට පෙනී යන්නේ නම්, යම් ගනුදෙනුවක් හෝ සියලුම ගනුදෙනු ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව විසින් රඳවා ගනියි.

2.9 මෙම ගිවිසුම අවසන් වීම සහ/හෝ කාඩ්පත ආපසු භාරදීම නොතකා, ක්‍රෙඩිට් කාඩ්පත හරහා බැංකුව විසින් පිරිනමා ඇති සියලුම ණයවර පහසුකම් සඳහා සහ ඒ යටතේ ඇති අදාළ සියලුම අයකිරීම් සඳහා  කාඩ්පත් හිමියා වගකිව යුතු වේ.

2.10 බැංකුව විසින් කාඩ්පත් ගිණුමට ණයවර සීමාවක් පනවනු ඇති අතර, කාඩ්පත් හිමියා එයට දැඩි ලෙස අනුගත විය යුතු වේ.  මෙම ගිවිසුම යටතේ දක්වා ඇති ආකාරයට හෝ කාඩ්පත් හිමියා වෙත දැනුම් දීමක් සිදුකිරීම මගින් බැංකුව විසින් කලින් කලට එම ණයවර සීමාව වෙනස් කළ හැකිය.  කාඩ්පත් හිමියාට ඔහුගේ/ඇයගේ ණයවර සීමාව ප්‍රතිශෝධනය කරන ලෙස ඕනෑම අවස්ථාවක ඉල්ලීමක් කළ හැකිය.  බැංකුව විසින්, එහි පූර්ණ අභිමතය පරිදි (මෙසේ සිදුකිරීමට බැඳී නැතත්) කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව එසේ පනවන ලද ණයවර සීමාව කලින් කලට වැඩිකිරීම (හෝ අඩුකිරීම), හෝ පවතින කාඩ්පතෙහි ශ්‍රේණිය ඉහළ දැමීම (හෝ පහළ දැමීම), හෝ කාඩ්පතෙහි ණයවර සීමාව ඉක්මවා යන පරිදි සිදුකරන කාඩ්පත් ගනුදෙනු සඳහා අවසර දීම සිදුකළ හැකි අතර, මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි නීතිරීතිවලට අනුකූලව අදාළ ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වනු ඇත.

2.11 කාඩ්පත කිසිදු නීතිවිරෝධී කටයුත්තක් සඳහා භාවිත නොකළ යුතුය.

## 3. බිල්ගත කිරීම හා ගෙවීම්

3.1 සාමාන්‍යයෙන් සෑම බිල්ගත කිරීමේ කාලසීමාවක ම අවසාන දිනයේ දී, එනම්, ගිණුම් ප්‍රකාශන දිනයේ දී, කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශනයක් එවනු ලබන අතර, කාඩ්පත් ගිණුමෙහි පවතින සමස්ත හිඟ මුදල (සමස්ත හිඟය), වර්තමාන බිල්ගත කිරීමේ කාලසීමාව සඳහා කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු අවම ගෙවීම, පසුගිය හිඟය, සීමාව ඉක්මවා ඇති හිඟය, සීමා ඉක්මවීමේ ගාස්තු සහ, සමස්ත හිඟ මුදල මත ගෙවිය යුතු සමස්ත අවම මුදල (ගෙවිය යුතු අවම මුදල) පිළිබඳ විස්තර ද, බැංකුව වෙත ගෙවීම සිදුකළ යුතු වන දිනය (ගෙවීම් නියමිත දිනය) ද එහි අන්තර්ගත වනු ඇත.

3.1.1 සීමාව ඉක්මවූ ගෙවිය යුතු මුදල සහ සීමා ඉක්මවීමේ ගාස්තුව, පසුගිය ප්‍රකාශන කාලසීමාව සඳහා නොගෙවූ අවම ගෙවීමක් ඇත්නම් එය (පසුගිය හිඟ මුදල) ද සමඟ වහාම ගෙවිය යුතු වේ. මෙම ගෙවීම් වහාම සිදුකළ යුතු අතර, එය 'පසුගිය හිඟ මුදල සහ සීමාව ඉක්මවීමේ ගාස්තුව" යනුවෙන් දැක්වෙනු ඇත. බැංකුව වෙත ගෙවන ලද කිසියම් ගෙවීමක් වලංගු වනු ඇත්තේ බැංකුව විසින් දැනුම් දෙන ලද ලිපිනය වෙත ලැබුණු පසුව කාඩ්පත් ගිණුමට බැර කරන ලද පසුව පමණි. මුදල්වලින් ගෙවන ලද කිසියම් ගෙවීමක් සැකසුමට අවම වශයෙන් වැඩකරන දින එකක් අවශ්‍ය වන අතර, චෙක්පත් උපලබ්ධි වීමෙන් පසු කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත. කාඩ්පත් හිමියාගේ ඉල්ලීම මත හෝ බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ගිණුම් ප්‍රකාශන කාලසීමාව වෙනස් කළ හැකිය.

3.1.2 ගිවිසුම්ගත අවම මුදල් ගෙවීම් අදාළ ගෙවීම් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් කාඩ්පත භාවිත කිරීම අවහිර කළ හැකිය.

3.1.3 කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගිණුමට සිදුකරන ගෙවීම්, බැංකුව විසින් තීරණය කරන ලද යම් අනුපිළිවෙලකට අනුව කාඩ්පත් හිමියාගේ වගකීම් පියවීම සඳහා යෙදවෙනු ඇත.

3.2 සමස්ත හිඟ මුදල ගිණුම් ප්‍රකාශනයෙහි දක්වා ඇති දිනය පසු නොකර සම්පූර්ණයෙන් ගෙවිය යුතුව පවතිනු ඇති අතර, මෙහි සඳහන් කළ ගෙවීම් නියමිත දිනයේ හෝ ඊට පෙර කාඩ්පත් ගිණුමට බැර පිණිස බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත එම ගෙවීම ලැබුණහොත් කාඩ්පත් හිමියාට කිසිදු මූල්‍ය ගාස්තුවක් දරන්නට සිදු නොවනු ඇත.

3.3 කාඩ්පත් හිමියා විසින් සමස්ත හිඟ මුදල පියවීමක් නොකිරීමට තීරණය කළහොත් ගෙවීම් නියමිත දිනයේ හෝ ඊට පෙර කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු අවම මුදල ගෙවිය යුතු වේ. පසුගිය බිල්පත් කාල සීමාවෙහි (සීමාවන්හි) නොගෙවූ අවම ගෙවීම් ද මෙම ගෙවිය යුතු අවම මුදලෙහි සමස්ත අගයට ඇතුළත් වේ. බැංකුව වෙත ගෙවන ලද කිසියම් ගෙවීමක් වලංගු වනු ඇත්තේ බැංකුව විසින් දැනුම් දෙන ලද ලිපිනය වෙත ලැබුණු පසු කාඩ්පත් ගිණුමට බැර කරන ලද පසුව පමණි.

3.4 කාඩ්පත් ගිණුම සඳහා කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ගෙවන ලද මුදල් බැංකුව විසින් තීරණය කරන ලද යම් අනුපිළිවෙලකට අනුව කාඩ්පත් හිමියාගේ වගකීම් පියවීම සඳහා යෙදවෙනු ඇත.

3.5 කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ගෙවන යම් මුදලක් කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත්තේ බැංකුව විසින් අදාළ කාඩ්පත් ගිණුමට අරමුදල් යොදවනු ලබන දිනයේ දී ය. මුදල්වලින් ගෙවන ලද කිසියම් ගෙවීමක් සැකසුම සඳහා අවම වශයෙන් වැඩකරන දින එකක් අවශ්‍ය වන අතර, චෙක්පත් උපලබ්ධි වීමෙන් පසු කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත.

3.6

(i) බැංකුවේ පවතින, කාඩ්පත් හිමියාගේ ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුමෙන් (පියවීමේ ගිණුම) සෘජුව මුදල් හර කිරීමට කාඩ්පත් හිමියා විසින් ස්ථාවර උපදෙස් ලබා දිය හැකිය.

(ii) එසේ ලබාදුන් කිසියම් ස්ථාවර උපදෙසක් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමක් ඊළඟ ගෙවීම් නියමිත දිනයට අවම වශයෙන් සති දෙකකට පෙර බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලැබිය යුතු බවට කාඩ්පත් හිමියා මෙමගින් එකඟ වෙයි.

බැංකුවේ පවතින, පියවීමේ ගිණුමෙන් මුදල් සෘජුව හර කිරීමට ලබාදෙන ස්ථාවර උපදෙස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අතිරේක නීතිරීති හා කොන්දේසි අදාළ වනු ඇත.

a. බැංකුව වෙත ලබාදෙන චෙක්පත් හෝ බැංකුව සමඟ සාකච්ඡා කරගත් වෙනත් ක්‍රමයකින් ලැබෙන මුදල් මත එම ස්ථාවර උපදෙස්වලට ප්‍රමුඛතාව ලබාදිය යුතු ආකාරය තීරණය කිරීමට බැංකුව අයිතිය රඳවා ගන්නා බවට කාඩ්පත් හිමියා මෙමගින් එකඟ වෙයි.
b. ස්ථාවර උපදෙස්වලට අනුව කටයුතු කිරීම පිණිස, ගෙවීම් නියමිත දිනයට පෙර දිනය වනවිට නියම කරන ලද කාඩ්පත් පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් තරම් මුදල් පවත්වා ගන්නා බවට කාඩ්පත් හිමියා එකඟ වෙයි. පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් තරම් මුදල් නොපැවතියහොත්, ස්ථාවර උපදෙස්වලට අනුව ගෙවිය යුතු මුදල අයකරගැනීම සඳහා බැංකුව විසින් කලින් කලට සිය අභිමතය පරිදි අයිරා ලබාදිය හැකිය. සියලුම හිඟ මුදල් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට අනුව ඒ මත එකතු වූ මූල්‍ය ගාස්තු ද සමඟ ඉල්ලූ විටෙක ආපසු ගෙවීමට කාඩ්පත් හිමියා බැඳී සිටියි.
c. ගෙවීම් නියමිත දිනයේ දී පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් ශේෂයක් නොපැවතියහොත්, එවිට එකී පියවීමේ ගිණුමෙහි පවතින මුදල් ප්‍රමාණය මත අයකරගැනීම්වල ප්‍රමුඛතා පිළිවෙල තීරණය කිරීමට බැංකුව අයිතිය රඳවා ගනියි. මූල්‍ය ගාස්තු ද ඇතුළත්ව ඒ මත ඇතිවන සියලුම ගාස්තු ගෙවීම සඳහා කාඩ්පත් හිමියා බැඳී සිටියි. උපදෙස් දුන් සමස්ත මුදල අයකර ගැනීමට ප්‍රමාණවත් තරම් මුදල් නියමිත කාඩ්පත් පියවීමේ ගිණුමෙහි නොපැවතියහොත් එහි පවතින යම් ශේෂයක් අයකරගැනීමට බැංකුව අයිතිය රඳවා ගනියි.

3.7 ශ්‍රී ලංකා රුපියල්වලින් හැර වෙනත් ව්‍යවහාර මුදල් වර්ගවලින් සිදුකරන කාඩ්පත් ගනුදෙනු, අදාළ පරිවර්තනය කිරීමේ දිනයේ දී බැංකුව විසින් තීරණය කරනු ලබන පවතින අනුපාතයකට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් පසුව කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

3.8 යම් ගනුදෙනුවක් අවලංගු කිරීමෙන්, ආපසු හැරවීමෙන් හෝ මුදල් ආපසු ගෙවීමෙන් සිදුවන යම් විනිමය පාඩුවීමක් සඳහා කාඩ්පත් හිමියා විසින් වගකිව යුතු වේ.

3.9 මෙම ගිවිසුමෙහි ඇති අනෙකුත් ප්‍රතිපාදනවලට අගතියකින් තොරව, කාඩ්පත් හිමියා මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන්නේ නම්, කාඩ්පත් ගිණුම පියවීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත පැහැදිලිව සහ නිශ්චිතව උපදෙස් ලබාදිය යුතු වන අතර, ඔහු/ඇය විසින් බැහැරව යාමට පෙර බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත උපදෙස් ලබාදිය යුතු වේ.

3.10 කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් මාසිකව නිකුත් කරනු ලබන ගිණුම් ප්‍රකාශනය කාඩ්පත් හිමියා විසින් සම්පූර්ණයෙන් පරීක්ෂා කළ යුතු අතර, කිසියම් වරදක් ඇත්නම් ගිණුම් ප්‍රකාශනයේ දින සිට දින 10ක් තුළ බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ඒ බව දන්වා සිටිය යුතුය. එම කාලසීමාවෙන් පසුව අදාළ ගිණුම් ප්‍රකාශනය සහ එහි අන්තර්ගතය (ඉහත කී පරිදි දැනුම් දී ඇති කිසියම් වරදක් ඇත්නම් එය හැර) නිවැරදි බවට බැංකුව හා කාඩ්පත් හිමියා අතරෙහි අවසානාත්මක ලෙසට සැලකෙනු ඇත. සියලුම මුද්‍රිත ගිණුම් ප්‍රකාශන කාඩ්පත් හිමියා විසින් අවසන් වරට ලිඛිතව බැංකුව වෙත සපයා ඇති ලිපිනය වෙත සාමාන්‍ය තැපෑලෙන් එවනු ලබන අතර, එසේ තැපැල් කිරීමෙන් පැය 48ක් තුළ එය ලැබී ඇති බවට සැලකෙනු ඇත.

a. මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමෙහි ඇති අනෙකුත් ප්‍රතිපාදනවලට අගතියකින් තොරව, සංක්‍රමණය හෝ විදේශ රටක සේවය කිරීම සඳහා කාඩ්පත් හිමියා මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අදහස් කරන්නේ නම්, අනේවාසික විදේශ මුදල් ගිණුමක් (NRFC) හරහා කාඩ්පත් ගිණුම පියවීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත පැහැදිලිව සහ නිශ්චිතව උපදෙස් ලබාදිය යුතු වන අතර, ඔහු/ඇය විසින් බැහැරව යාමට පෙර බැංකුව වෙත එම උපදෙස් ලබාදිය යුතු වේ.

b. මාසික ගිණුම් ප්‍රකාශනය නොලැබීම, මුදල් නොගෙවා සිටීමට වලංගු හේතුවක් ලෙස නොසැලකේ. {අදාළ ගිණුම් ප්‍රකාශනය නිකුත් කිරීමේ දින සිට දින දහහතරක් (14) තුළ හෝ නව කාඩ්පතක් සම්බන්ධයෙන් නම් කාඩ්පත අනුමත කරන ලද දින සිට දින දහහතරක් තුළ ගිණුම් ප්‍රකාශනය නොලැබුණහොත් කාඩ්පත් හිමියා විසින් ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.}

**4. ගාස්තු සහ අයකිරීම්**

4.1 නව කාඩ්පතක් සඳහා සම්බන්ධවීමේ ගාස්තුව හා වාර්ෂික ගාස්තුව බැංකුව වෙත ගෙවීමට කාඩ්පත් හිමියා මෙමගින් එකඟ වේ. බැංකුවේ වර්තමාන අයකිරීම්වලට අනුව එම ගාස්තු ගෙවිය යුතු අවස්ථාවේ දී කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත. ඕනෑම අවස්ථාවක දී ගාස්තු වෙනස් කිරීමට බැංකුවට අයිතිය පවතිනු ඇත.

4.2 විදේශ ලිපිනයක් වෙත දූතසේවා මගින් කාඩ්පත යවනු ලබන විට, ඒ සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.3 ණය සීමාව ඉහළ දැමීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.4 කාඩ්පත් ගිණුම් ප්‍රකාශනයේ අනු-පිටපත් නිකුත් කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව හැසිරවීමේ ගාස්තුවක් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.5 ගෙවීම් නියමිත දිනයේ දී කාඩ්පත් හිමියා විසින් සමස්ත හිඟ මුදල පියවීමක් සිදු නොකරන්නේ නම්, ප්‍රකාශන දිනය වන විට පවතින හිඟ ශේෂය මත ගනුදෙනුවෙහි දිනයේ සිට බිල්පත් කාලසීමාව පුරා දෛනික ශේෂය මත ගණනය කරන ලද මූල්‍ය ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව අයකෙරෙනු ඇත. ගිණුම් ප්‍රකාශන දිනයෙහි දී මූල්‍ය ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.6 ඉහත 4.5 ඡේදයේ සඳහන් කර ඇති මූල්‍ය ගාස්තුව ගෙවීමට අගති විරහිතව, ගෙවීම් නියමිත දිනය වනවිට ගෙවිය යුතු අවම මුදල ගෙවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වන්නේ නම්, ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව අයකර කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.7 කාඩ්පත් හිමියා විසින් හෝ වෙනත් යම් පාර්ශ්වයක් විසින් බැංකුව වෙත ඉදිරිපත් කරන ලද හෝ නිකුත් කළ යම් චෙක්පතක් හෝ වෙනත් යම් ගෙවීම් නියෝගයක් හෝ කිසියම් හේතුවක් මත අගරු වුවහොත්, බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව හැසිරවීමේ ගාස්තුවක් බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙතින් අයකර කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.8 සියලුම මුදල් අත්තිකාරම් සඳහා, මුදල් අත්තිකාරම් ගාස්තුවක් සහ/ හෝ හැසිරවීමේ ගාස්තුවක් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව අයකර, කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත. කාඩ්පත භාවිත කර මිලදී ගන්නා ලද, වහාම මුදල් බවට පත්කළ හැකි ආකාරයේ සංචාරක චෙක්පත්, ඉල්ලුම් අණකර, ටෙලිග්‍රාෆ් ප්‍රේෂණ වැනි සාධන පත්‍ර ද මුදල් අත්තිකාරම් ලෙස සැලකෙනු ඇති අතර, එය ඉහත කී ගාස්තුවලට ඒවා යටත් වනු ඇත.

4.9 බිල්පත් කාලසීමාව තුළ යම් අවස්ථාවක නියමිත ණයවර සීමාව ඉක්මවා ගියහොත් බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව සීමාව ඉක්මවීමේ ගාස්තුවක් අයකර, කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

ණයවර සීමාව ඉක්මවා ගොස් ඇත්දැයි ගණනය කිරීමේ දී බැංකුව විසින් අයකරනු ලබන පොලී, බදු සහ බැංකු ගාස්තුවල ප්‍රමාණය ද සලකා බැලෙනු ඇත.

4.10 කාඩ්පත භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල්වලදී මිලදී ගනු ලබන සියලුම පෙට්‍රල්, ඩීසල්, ගෑස් සහ වෙනත් සැපයුම් සඳහා හැසිරවීමේ ගාස්තුවක් අයකෙරෙන අතර, එය බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

4.11 2016 ජනවාරි 01 දින සිට ශ්‍රී ලංකාව හැර වෙනත් රටවලදී සිදුකරන ලද සෑම ක්‍රෙඩිට් කාඩ්පත් ගනුදෙනුවක් සඳහා ම, එම ගනුදෙනුව සිදුවන අවස්ථාවේ කාඩ්පත පැවතිය ද නොපැවතිය ද ඒ බව නොසලකා, කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුම සඳහා මුද්දර ගාස්තු අයකරනු ලැබේ. මෙය ව්‍යවස්ථාපිත අයකිරීමක් වන අතර, කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම්දීමකින් තොරව මෙය කලින් කලට සංශෝධනය විය හැකිය.

## 5. අමතර කාඩ්පත් සහ/ හෝ අතිරේක කාඩ්පත්

බැංකුවේ අභිමතය පරිදි, කාඩ්පත් හිමියාගේ සහ අමතර/අතිරේක කාඩ්පත/කාඩ්පත් හිමියාගේ/ හිමියන්ගේ හවුල් ලිඛිත ඉල්ලීම මත බැංකුව විසින් අමතර කාඩ්පතක් (කාඩ්පත්)/ අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) නිකුත් කළ හැකිය. කාඩ්පත් ගිණුම් එක් ව හෝ වෙන්කර පැවතිය ද, කාඩ්පත හා අමතර

කාඩ්පත (කාඩ්පත්)/ අතිරේක කාඩ්පත (කාඩ්පත්) භාවිතය සම්බන්ධව කාඩ්පත් හිමියා සහ අමතර/ අතිරේක කාඩ්පත් හිමියා(හිමියන්) යන දෙදෙනා ම එක් ව සහ වෙන් වෙන් ව වගකිව යුතු වනු ඇත. අමතර/අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) අතරින් අයෙකු සහ/හෝ සියලුදෙනා මෙම ගිවිසුමෙහි නීතිරීති හා කොන්දේසි මගින් බැඳී සිටිනු ඇත.

සැක දුරුකිරීම සඳහා, කාඩ්පත භාවිත කිරීම පිළිබඳව කාඩ්පත් හිමියාගේ සහ අමතර/ අතිරේක කාඩ්පත් හිමියාගේ (හිමියන්ගේ) හවුල් හා වෙන් වෙන් වගකීම්වලට අමතරව, කාඩ්පත් හිමියා සහ අමතර/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) යන දෙදෙනා ම විසින් ඇති කරන ලද සියලුම වගකීම් සඳහා අවසාන වගකීම කාඩ්පත් හිමියා වෙත පවතිනු ඇත.

## 6. ඒටීඑම් (ATM) යන්ත්‍ර භාවිතය සහ රහස්‍ය අංකය (PIN)

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවලට (“ATM”) ප්‍රවේශ වීමේ පහසුකම ක්‍රෙඩිට් කාඩ්පතට අන්තර්ගත කර ඇති විට, ඒටීඑම් යන්ත්‍රවලදී, අලෙවි ස්ථානවලදී (“POS”) හෝ වෙනත් ආකාරයකින් එම ක්‍රෙඩිට් කාඩ්පත මගින් විද්‍යුත් ක්‍රමයෙන් බැංකු ගනුදෙනු සිදුකිරීම සඳහා භාවිත කළ හැකිය. එවැනි පහසුකමක් භාවිත කිරීම, මෙම ගිවිසුමෙහි දැක්වෙන නීතිරීති හා කොන්දේසිවලට අමතරව, බැංකුවේ ඒටීඑම් කාඩ්පත් නීතිරීති හා කොන්දේසිවලට යටත් වන අතර, ඉල්ලූ විටෙක බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙතින් එහි පිටපතක් ලබාගත හැකිය.

කාඩ්පත් හිමියා විසින් ඒටීඑම් යන්ත්‍ර මගින්, දුරකථනය මගින්, අන්තර්ජාල බැංකු පහසුකම මගින් සිදුකරන ලද යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් මතුවන මතභේදයක් පිළිබඳව බැංකුව විසින් පරීක්ෂා කර බලනු ඇති අතර, බැංකුවට සතුටුදායක පරිදි වෙනත් ආකාරයකට ඔප්පු නොවුවහොත්, ඉහත කී කිසියම් ආකාරයකින් සිදුකරන ලද ගනුදෙනුවක් සම්බන්ධයෙන් වගකීම කාඩ්පත් හිමියා වෙත පැවරෙනු ඇත. මීට පටහැනිව කිසිවක් මෙහි අන්තර්ගත වුවද ඒ බව නොසලකා, ඒටීඑම් ගනුදෙනු සඳහා රහස්‍ය අංකය ද අවශ්‍ය වන හෙයින් නැතිවූ කාඩ්පත් පිළිබඳව වාර්තා කිරීම මගින් මෙම වගකීම අත්හිටුවීම හෝ අවලංගු කිරීමක් සිදු නොවනු ඇත. රහස්‍ය අංකය ආරක්ෂා කර, සුරක්ෂිත කරගැනීමට ද, එම රහස්‍ය අංකය කාඩ්පතෙන් වෙන්කර තබාගැනීමට ද කාඩ්පත් හිමියන් වෙත විශේෂිතව ම උපදෙස් ලබා දී ඇති අතර, එසේ කිරීමට අපොහොසත් වීම, එමගින් ඇතිවන යම් වගකීමක් පිළිගැනීමක් ලෙස සැලකෙනු ඇත.

## 7. ගිවිසුම අවසන් කිරීම

7.1 ඕනෑම අවස්ථාවකදී කාඩ්පත සහ අමතර/අතිරේක කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදෙමින් බැංකුව වෙත ලිඛිත දැනුම්දීමක් සිදුකිරීම මගින්, කාඩ්පත් හිමියා විසින් සහ අමතර/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) ඇත්නම් ඔවුන් ද විසින් මෙම ගිවිසුම අවසන් කළ හැක. ආපසු භාරදෙන කාඩ්පත් කැබලි දෙකකට කපා දැමිය යුතුය.

7.2 කාඩ්පත අවලංගු කිරීම මගින් හෝ කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින්, පූර්ව දැනුම්දීමක් සහිතව හෝ රහිතව, යම් හේතුවක් සහිතව හෝ රහිතව, සිය පූර්ණ අභිමතය පරිදි බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී මෙම ගිවිසුම අවසන් කළ හැකිය. එසේ අවසන් කිරීමක් සිදුවන තෙක් සහ එසේ සිදු නොවුවහොත්, බැංකුව විසින් කලින් කලට කාඩ්පත් හිමියා වෙත නව කාඩ්පතක් (අලුත් කිරීමේ කාඩ්පත) සපයනු ඇත.

7.3 මෙම ගිවිසුම අවසන් කළ විටෙක හෝ කාඩ්පත් හිමියා බුන්වත් භාවයට පත්වුවහොත් හෝ මරණයට පත් වුවහොත්, කාඩ්පත් ගිණුමෙහි පවතින සමස්ත හිඟ ශේෂය, දැනට සිදුකර ඇති නමුත් තවමත් කාඩ්පත් ගිණුමෙන් අයකර නොමැති ගනුදෙනුවල අගය ද සමඟ වහාම සම්පූර්ණයෙන් බැංකුව වෙත ගෙවිය යුතු වනු ඇත. කාඩ්පත් ගිණුමෙහි හිඟයක් පවතින්නේ නම් එය පියවීම පිණිස කාඩ්පත් හිමියා හෝ ඔහුගේ/ඇයගේ බූදලය වගකීමට ලක්වන අතර, එම හිඟය අයකරගැනීමේ දී දරන්නට සිදුවන සියලුම පිරිවැය (නීතිමය ගාස්තු ද ඇතුළත්ව), ගාස්තු සහ වියදම් සඳහා බැංකුව වෙත හානිපූරණය කළ යුතුය. අදාළ කාඩ්පත් ගිණුමෙහි සමස්ත හිඟ මුදල පියවන තෙක් හා එසේ පියවීම නොකළහොත්, පවතින අනුපාතයට (අනුපාතයන්ට) අනුව මූල්‍ය ගාස්තු හා වෙනත් ගාස්තු සහ අයකිරීම් අඛණ්ඩව සිදුකිරීමට බැංකුවට හිමිකම පවතිනු ඇත.

7.4 යම් පාර්ශ්වයක් විසින් මෙම ගිවිසුම අවසන් කළ ද ඒ බව නොතකා, එසේ අවසන් කරන අවස්ථාව වනවිට (පොලී, බදු සහ ගාස්තු ද ඇතුළත්ව) කාඩ්පත් ගිණුම මත පවතින සමස්ත හිඟ මුදල සම්බන්ධයෙන් සහ කාඩ්පත භාවිතයෙන් ඇතිවූ අනෙකුත් සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා අඛණ්ඩව වගකීමට බැඳී සිටිනු ඇත.

## 8. කාඩ්පත නැතිවීම

8.1 කාඩ්පත නැතිවීම හෝ සොරකම් කරනු ලැබීම සම්බන්ධව එසේ නැතිවීම/සොරකම් කිරීම දැනගත් වහාම දුරකථනයෙන්, ෆැක්ස් මගින් හෝ ටෙලෙක්ස් මගින් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ද, පොලීසිය වෙත ලිඛිතව ද, (විදේශගතව සිටී නම් ඕනෑම වීසා කාඩ්පත් සාමාජිකයකු වෙත ද) වාර්තා කළ යුතු වේ. නමුත් එවැනි ඕනෑම අවස්ථාවකදී එම දුරකථන, ෆැක්ස් හෝ ටෙලෙක්ස් පණිවුඩය කාඩ්පත් හිමියාගේ හෝ ඔහුගේ ඇටෝර්නි බලකරුගේ අත්සන සහිතව වහාම ලිඛිතව තහවුරු කළ යුතු වේ. කාඩ්පත නැතිවීම හෝ සොරකම් කරනු ලැබීම පිළිබඳ තොරතුරු බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත හෝ වීසා කාඩ්පත් සාමාජිකයකු වෙත දැනුම් දී, ඉන් පසුව ලිඛිතව තහවුරු කරන තෙක් කාඩ්පත අනවසරයෙන් භාවිත කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස කාඩ්පත් ගිණුමට හර කෙරෙන සියලුම මුදල් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වගකිව යුතු වේ. නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පත (කාඩ්පත්) කාඩ්පත් හිමියා විසින් සොයාගත හොත්, එසේ සොයාගන්නා ලද කාඩ්පත (කාඩ්පත්) කාඩ්පත් හිමියා විසින් වහාම බැංකුව වෙත භාරදිය යුතු වේ.

8.2 කාඩ්පත නැතිවීම, සොරකම් කරනු ලැබීම හෝ අවභාවිත කරන ලද තත්ත්වයන් පිළිබඳ කාඩ්පත් හිමියා වෙත පවතින සියලුම තොරතුරු කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත ලබාදිය යුතු වන අතර, නැතිවූ කාඩ්පත සොයාගැනීම සඳහා සහය වීම පිණිස බැංකුව විසින් ඉල්ලා සිටින විට අවශ්‍ය යැයි සැලකෙන සියලුම පියවර ගත යුතු වේ.

8.3 නැතිවීමක් හෝ සොරකම් කිරීමක් සිදු වූ විට කාඩ්පත් හිමියා වෙත අලුත් කාඩ්පතක් නිකුත් කිරීමට බැංකුව බැඳී නොසිටියි. අලුත් කාඩ්පතක් නිකුත් කිරීම සඳහා හැසිරවීමේ ගාස්තුවක් අයකෙරෙනු ඇති අතර, බැංකුව විසින් තීරණය කරන අනුපාතයකට අනුව එය කාඩ්පත් ගිණුමට හර කෙරනු ඇති අතර, බැංකුව විසින් තීරණය කරන්නේ නම්, මුල් කාඩ්පතට සමාන නීතිරීති හා කොන්දේසි යටතේ ම එම අලුත් කාඩ්පත නිකුත් කෙරෙනු ඇත.

## 9. සාමාන්‍ය

9.1 ණය සීමාව ඉක්මවීමට කාඩ්පත් හිමියා විසින් බැංකුවෙන් පූර්ව ලිඛිත අවසරයක් ලබාගෙන ඇත්නම් හැර, නියමිත ණය සීමාව තුළ රැඳී සිටීමට කාඩ්පත් හිමියා භාරගෙන සිටින අතර, සමස්ත හිඟ මුදල, එම ණය සීමාව ඉක්මවා නොයන සේ ගනුදෙනු සිදුකිරීමට ද වැඩිදුරටත් භාරගෙන සිටියි.

9.2 කාඩ්පත් හිමියාගේ රැකියාව සහ/හෝ කාර්යාලය හෝ නිවසෙහි ලිපිනය සහ දුරකථන අංකවල කිසියම් වෙනසක් සිදු වුවහොත් කාඩ්පත් හිමියා විසින් ඒ බව වහාම ලිඛිතව බැංකුව වෙත දැනුම් දිය යුතු වේ.

9.3 කාඩ්පත් හිමියා වෙත තැපැලෙන් ලබාදිය යුතු දැන්වීම් හෝ ලිපි ලේඛන කාඩ්පත් හිමියා විසින් අවසන් වරට ලිඛිතව බැංකුව වෙත සපයා ඇති ලිපිනය වෙත එවනු ලබන අතර, එම දැන්වීම්/ලිපි ලේඛන එසේ තැපැල් කිරීමෙන් පැය 48ක් තුළ ලැබී ඇති බවට සැලකෙනු ඇත.

9.4 බැංකුව විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක, කාඩ්පත් හිමියා විසින් ඔහුගේ/ඇයගේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. එසේ ඉදිරිපත් කළ තොරතුරු තහවුරු කර ගැනීමට ද කාඩ්පත් හිමියා බැංකුවට වැඩිදුරටත් අවසර ලබාදෙයි. එම තොරතුරු ඉල්ලා සිටි විට ඉදිරිපත් නොකළහොත්, බැංකුව විසින් සිය අභිමතය පරිදි කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ වහාම කාඩ්පත අවලංගු කිරීම හෝ සිදුකළ හැකිය.

9.5 බැංකුව වෙත ලැබී ඇති තොරතුරු (කාඩ්පත් හිමියා විසින් හෝ වෙනත් ආකාරයකින් සැපයෙන ලද) මත පදනම්ව, කාඩ්පත් ගිණුම හෝ කාඩ්පත භාවිතයේ දී කාඩ්පත් හිමියා දැඩි ලෙස නොසැලකිලිමත් හෝ වංචනික බවට බැංකුව අදහස් කරන්නේ නම්, (කාඩ්පත, ගිණුම හෝ රහස්‍ය අංකය ආරක්ෂා කිරීම සහ එය නැතිවීම හෝ අනවසර ගනුදෙනු පිළිබඳව වාර්තා කිරීම ද මෙයට ඇතුළත් වේ) කාඩ්පත මගින් සිදුකරන ලද අනවසර ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියාගේ වගකීම ඉහළ දැමෙනු ඇත. කාඩ්පත භාවිත කරමින් සිදුකරන ලද යම් යම් ගනුදෙනු හා වෙළඳ කාණ්ඩ පිළිබඳව විශේෂිත පරීක්ෂණයක් අවශ්‍ය බවට බැංකුව විසින් තීරණය කරන්නේ නම්, සහ කාඩ්පත් හිමියාගේ ගිණුම් ඉතිහාසය අසතුටුදායක බවට බැංකුව නිරීක්ෂණය කරන්නේ නම්, හෝ ගනුදෙනුවෙහි ස්වභාවය අනුව කාඩ්පත් හිමියාට කිසිදු ආපසු ගෙවීමක් සිදුකිරීමට සාධාරණ හේතුවක් නොමැති නම්, මතභේදයට ලක්වූ ගනුදෙනුවල වටිනාකම බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ආපසු නොගෙවන බවට කාඩ්පත් හිමියා එකඟ වී පිළිගෙන සිටියි.

9.6 යම් ක්‍රමවේදයකට සහභාගී වන්නන්ගේ ප්‍රතිලාභ විශාල වශයෙන් රඳා පවතිනුයේ,

(අ) එම ක්‍රමවේදයට සහභාගී වන්නන්ගේ සංඛ්‍යාව වැඩිකිරීම මත නම් හෝ,

(ආ) එම ක්‍රමවේදයට සහභාගී වන්නන් විසින් ලබාදෙන දායකත්වය ඉහළ දැමීම මගින් නම්,

සහභාගි වන්නෙකු විසින් කාඩ්පත භාවිත කරමින් දායකවීමට හෝ මුදල් ගෙවීමට හෝ මූල්‍ය වටිනාකමක් ගෙවීමට නියම කෙරෙන ක්‍රමවේදයක් සෘජුව හෝ වක්‍ර ලෙස හඳුන්වා දීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, දැන්වීම් පළකිරීම, පවත්වාගෙන යාම, මුදල් සැපයීම, කළමනාකරණය කිරීම, හෝ මෙහෙයවීම කාඩ්පත් හිමියා විසින් නොකළ යුතුය

බැංකුව විසින් වැරදීමකින් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුම බැර කරනු ලැබුවහොත් ඕනෑම අවස්ථාවක දී එම ඇතුළත් කිරීම ආපසු නිවැරදි කිරීමට සහ/හෝ එම මුදල කාඩ්පත් හිමියා වෙතින් ආපසු ඉල්ලා සිටීමට බැංකුවට හිමිකම පවතිනු ඇත.

## 10. දුරකථන, ටෙලෙක්ස් ෆැක්ස් සහ ඊමේල් මගින් ලබාදෙන උපදෙස් සඳහා අවසර දීම සහ හානිපූරණය

10.1 ඉහත දක්වා ඇති කරුණුවල පොදු භාවයට අගති විරහිතව, උපදෙස් ලබාදෙන හෝ ලබාදෙන බවට සැලකෙන තැනැත්තාගේ බලය හෝ අනන්‍යතාව සම්බන්ධයෙන් බැංකුවෙහි පාර්ශ්වයෙන් විමර්ශනයක් නොමැතිව සහ, එම උපදෙස් ලැබෙන අවස්ථාවේ පවතින තත්ත්වයන් නොසලකා, කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථනයෙන්, ටෙලෙක්ස් මගින් හෝ ඊමේල් මගින් කලින් කලට ලබාදෙන හෝ ලබාදෙන බවට සැලකෙන දැන්වීම්, උපදෙස්, ඉල්ලීම් හෝ වෙනත් පණිවුඩ හුවමාරු (‘උපදෙස්’) මත විශ්වාසය තැබීමට සහ ඊට අනුව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත අවසර ලබාදෙයි. උපදෙස් ලැබුණු වේලාව/දිනය සම්බන්ධයෙන් බැංකුවේ තීරණය අවසානාත්මක ලෙසට කාඩ්පත් හිමියා විසින් පිළිගත යුතු වේ.

10.2 කාඩ්පත් හිමියා වෙතින් ලැබෙන උපදෙස්වලට සම්පූර්ණ අවසරය හිමි බවට ද එමගින් කාඩ්පත් හිමියා සම්පූර්ණයෙන් බැඳී සිටින බවට ද සැලකීමට බැංකුවට හිමිකම පවතින අතර, උපදෙස් ලැබෙනුයේ මුදල් ගෙවීමක් සිදුකිරීමට හෝ එසේ නොමැතිනම් කාඩ්පත් හිමියාගේ නමින් පවතින ගිණුමක් හර කිරීමට හෝ ගිණුමක් බැර කිරීමට වුවද, නැතහොත් වෙනත් යම් ආකාරයක ගනුදෙනුවකට හෝ සැලසුමකට කාඩ්පත් හිමියා බන්ධනය කිරීමට වුවද, එම ගනුදෙනුවෙහි හෝ සැලසුමෙහි ස්වභාවය හෝ ඊට සම්බන්ධ මුදල් ප්‍රමාණය පිළිබඳව නොසලකා සහ, එම උපදෙස්වල යෙදුම්වල පවතින යම් වරදක්, අපැහැදිලි බවක්, වරදවා වටහා ගැනීමක් හෝ පැහැදිලි බව අඩුවීමක් නොසලකා, එම උපදෙස් සම්බන්ධයෙන් හෝ එම උපදෙස් මත විශ්වාසය තැබීමේදී බැංකුව විසින් සුදුසු යැයි සැලකන පරිදි යම් යම් පියවර ගැනීමට බැංකුවට හිමිකම පවතිනු ඇත.

10.3 කාඩ්පත් හිමියා විසින් ලබාදෙන මෙම අවසරය සහ හානිපූරණයට අනුකූලව බැංකුව විසින් ක්‍රියා කිරීම සලකා බලා, බැංකුවට විඳින්නට සිදුවන හෝ දරන්නට සිදුවන, එම උපදෙස්වලින් හෝ ඒ සම්බන්ධයෙන් ඕනෑම ආකාරයකින් පැන නගින ඕනෑම ස්වභාවයක සියලුම පාඩු, අයැදීම්, නඩු, නීතිමය ක්‍රියාමාර්ග, ඉල්ලීම්, වන්දි, පිරිවැය හා වියදම් සඳහා බැංකුව හානිපූරණය කිරීමට අවලංගු කළ නොහැකි ලෙස කාඩ්පත් හිමියා භාරගෙන සිටියි.

10.4 කටයුතු කිරීමට සාධාරණ කාලයක් සහිතව, කාඩ්පත් හිමියා වෙතින් මෙය අවසන් කිරීමේ දැන්වීමක් නොලැබුණහොත් සහ එසේ ලැබෙන තෙක්, මෙම අවසර දීමේ සහ හානිපූරණයේ නීතිරීති සම්පූර්ණයෙන් බලාත්මකව පවතිනු ඇති අතර, එසේ අවසන් කිරීම මගින්, අදාළ උපදෙස්වල කාලය ඉකුත්වීමට පෙරාතුව මෙම අවසර දීමේ සහ හානිපූරණයේ නීතිරීතිවලට අනුකූලව සිදුකරන ලද ක්‍රියාවක් සම්බන්ධව මෙම අවසර දීම සහ හානිපූරණය යටතේ කාඩ්පත් හිමියා වෙත පවතින කිසිදු වගකීමකින් නිදහස් විය නොහැක.

## 11. නිදහස් කිරීම් සහ බැහැරකිරීම්

11.1 යම් අලෙවිකරුවෙකු හෝ ආයතනයක් විසින් කාඩ්පතට සැලකීම හෝ පිළිගැනීම හෝ සම්පූර්ණ හා අවසරලත් ණය සීමාව දක්වා ණයවර පහසුකම් ලබාදීම සහ, මුදල් අත්තිකාරම් සම්බන්ධයෙන් සම්පූර්ණ හා අවසරලත් මුදල් අත්තිකාරම් සීමාව දක්වා ලබාදීම ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී.

11.2 කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාවිත කරමින් ලබාගත් හෝ මිලදී ගන්නා ලද භාණ්ඩ සහ/හෝ සේවාවන්හි වරදක් හෝ දෝෂයක් සඳහා බැංකුව වගකිව යුතු නොවේ. මහජනයා වෙත අලෙවිය හෝ පරිභෝජනය සඳහා භාණ්ඩ සහ/හෝ සේවා පිරිනමන දැන්වීම්, පොත්, සඟරා, වාර සඟරා, තැපැල් අණකර ආකෘතිපත්‍ර, අත්පත්‍රිකා හෝ වෙනත් යම් ලේඛනයක අඩංගු ප්‍රකාශන, වචන, රූප හෝ වෙනත් යම් නිරූපනයක් සම්බන්ධයෙන් බැංකුව වගකිව යුතු නොවේ. කාඩ්පත් හිමියා විසින් අලෙවිකරුවන්ට එරෙහි පැමිණිලි එම අලෙවිකරුවා වෙත හෝ ආයතනය වෙත යොමු කළ යුතු වන අතර, අලෙවිකරුවාට හෝ ආයතනයකට එරෙහිව කාඩ්පත් හිමියා විසින් සිදුකරන ඉල්ලීම් මගින් මේ යටතේ කාඩ්පත් හිමියාට, බැංකුව වෙත පවතින බැඳීම්වලින් නිදහස් වීමට නොහැක.

11.3 යම් ATM යන්ත්‍රයක, හෝ සන්නිවේදන පද්ධතියක හෝ පහසුකමක හෝ දත්ත සැකසුම් පද්ධතියක හෝ සම්ප්‍රේෂණ සබඳතාවක බිඳවැටීමක් හෝ අවහිර වීමක් හේතුවෙන් හෝ, කාර්මික හෝ වෙනත් ආකාරයක ආරවුලක් හෝ වෙනත් ඕනෑම හේතුවක් මගින් පැන නගින ඕනෑම ආකාරයක අපහසුතාවක්, පාඩුවක්, හානියක් හෝ දුෂ්කරතාවක් සම්බන්ධයෙන්, එය බැංකුවේ පාලනයෙන් පරිබාහිර හේතුවක් වුවද එසේ නොවුවද, බැංකුව කිසිදු අයුරකින් කාඩ්පත් හිමියා වෙත වගකීමට බැඳී නොමැත.

11.4 බැංකුව විසින් සෑම මාසයකම යම් දිනයක් ගිණුම් ප්‍රකාශන දිනය ලෙස සහ ක්‍රෙඩිට් කාඩ්පතෙහි මුදල් ගෙවීමට නියමිත දිනය ලෙස තෝරාගනු ඇත. මාසික පදනමින් කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශනය භාරදීමට බැංකුවට නොහැකි වුවද ගෙවිය යුතු මූල්‍ය ගාස්තු ද ඇතුළත්ව ගෙවීම් වහාම සිදුකිරීමට කාඩ්පත් හිමියා වෙත ඇති වගකීම පවතිනු ඇත.

11.5 කාඩ්පතෙහි අඩංගු, සලකුණු කර ඇති හෝ කේතනය කර ඇති තොරතුරු නිරූපනය වන, නිසි ලෙස සම්පූර්ණ කර ඇති ගනුදෙනු වාර්තා ණයවර වවුචර, මුදල් ලබාදීමේ අණකර සහ/හෝ වෙනත් අයකිරීම් වාර්තාවකට ගරු කිරීමට බැංකුවට හිමිකම පවතියි.

11.6 සියලුම ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා, අලෙවි ලදුපත්, සහ ගිණුම් ප්‍රකාශන සියලුම කාර්යයන් සඳහා අවසානාත්මක වන බවට ද එමගින් කාඩ්පත් හිමියා බැඳී සිටින බවට ද කාඩ්පත් හිමියා මෙමගින් එකඟ වේ.

11.7 බැංකුවේ අත්පත්‍රිකා, ප්‍රකාශන හෝ පළකිරීම්වල දැන්වීම්කරුවන් විසින් සපයා ඇති සේවාවන්, සැලසුම් හෝ ප්‍රතිලාභ අසාර්ථකවීමක් හෝ එහි ප්‍රතිවිපාක ලෙස ඕනෑම ආකාරයකින් පැන නගින කිසිදු ආකාරයක අයැදීමක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් කාඩ්පත් හිමියා වෙත වගකීමට බැඳී නොමැත.

11.8 කාඩ්පත් ගිණුමෙහි බැර ශේෂයක් පවතින්නේ වුවද ඒ බව නොතකා, බැංකුව විසින් සුදුසු යැයි සලකන්නේ නම්, ඕනෑම ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීමට අයිතිය බැංකුව රඳවා ගනියි.

11.9 පුනරාවර්තිත ගනුදෙනු සම්බන්ධයෙන්, ගනුදෙනුවල වටිනාකම කාඩ්පත් ගිණුමට හරවීම වළක්වා ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් අලෙවිකරුගේ අලුත්කිරීමේ ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීම හෝ ඒවා අවලංගු කිරීම සිදුකළ යුතුය. කාඩ්පත් හිමියා අලෙවිකරුගේ අලුත්කිරීමේ ගිවිසුම්වලට අනුකූලව කටයුතු කිරීමට හෝ ඒවා අවලංගු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් වගකියනු නොලැබේ.

කාඩ්පත් හිමියා විසින් අලෙවිකරු/සංවිධානය/සංවිධාන වෙත සපයන ලද ක්‍රෙඩිට් කාඩ්පත් අංකය, අවලංගුවන දිනය, පුද්ගලික විස්තර ආදී තොරතුරුවල යම් වෙනසක් සිදුවන්නේ නම්, පුනරාවර්තිත ගනුදෙනු/ ස්ථාවර උපදෙස් අඛණ්ඩව ක්‍රියාත්මක වීම පිණිස සහ ඊට බාධා සිදුවීම වළක්වා ගැනීම පිණිස කාඩ්පත් හිමියා විසින් ඒ බව අදාළ අලෙවිකරු/සංවිධානය/සංවිධාන වෙත දැනුම් දිය යුතු වේ. කාඩ්පත් හිමියා විසින් ඉහත කී පරිදි අලෙවිකරු/සංවිධානය/සංවිධාන වෙත දැනුම් දීමට අපොහොසත් වීම හේතුවෙන් ඇතිවිය හැකි කිසිදු ප්‍රතිවිපාකයක් සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් නොදරනු ඇත.

## 12. නීතිමය ක්‍රියාමාර්ග

කිසියම් හේතුවක් මත, කාඩ්පත් හිමියා මෙම ගිවිසුමෙහි අන්තර්ගත නීතිරීති හා කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් බැංකුව විසින් මෙම කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම අවලංගු කරනු ඇති අතර, ඒ යටතේ ගෙවිය යුතුව පවතින සියලුම මුදල් අයකරගැනීමට කටයුතු කරනු ඇත. මේ සම්බන්ධයෙන් බැංකුවට දරන්නට සිදුවන නීතිමය ගාස්තු ද ඇතුළත්ව සියලුම පිරිවැය, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් වගකිව යුතු වේ.

## 13. විනිමය පාලන රෙගුලාසි

13.1 විනිමය පාලන පනතෙහි ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මහා බැංකුවේ හා ඒ යටතේ ඇති වෙනත් නියාමන ආයතනවල නියෝග, රෙගුලාසි, මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව ඔහු/ඇය විසින් සෑම විටෙක ම කාඩ්පත භාවිත කරන බවට කාඩ්පත් හිමියා සහතික විය යුතුය ('විනිමය පාලන පනත').

13.2 කාඩ්පත් හිමියා විසින් විදේශ රටවල දී කාඩ්පත භාවිත කළ යුත්තේ, පෞද්ගලික ස්වභාවයේ ප්‍රවාහන, නවාතැන්, වෛද්‍ය වියදම්, ජීවන වියදම්, විදේශීය ආයතනයකට හෝ අධ්‍යාපන ආයතනයකට ගෙවිය යුතු ලියාපදිංචි වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක ගාස්තු සහ, පෞද්ගලික භාවිතය සඳහා විදේශයන්හි දී භාණ්ඩ මිලදී ගැනීම්, පෞද්ගලික ස්වභාවයේ සංචාරක හා සෞඛ්‍ය රක්ෂණ පමණක් සඳහා රක්ෂණ වාරික, සහ/හෝ ඊමේල්, අන්තර්ජාලය, දුරකථන හරහා සිදුකරන ගනුදෙනු, විදේශ මුදල්වලින් බිල්ගත කරන වියදම්, ගමන් වියදම්, හෝටල් ගාස්තු, අවස්ථානුකූල වියදම් හා වෛද්‍ය වියදම් වැනි පෞද්ගලික වියදම්, සහ පෞද්ගලික භාවිතයට භාණ්ඩ මිලදී ගැනීම් සඳහා පමණි. ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධ ගෙවීම් සඳහා සහ වාණිජ ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ ආනයනය කිරීමට මිලදී ගැනීම සඳහා කාඩ්පත භාවිත නොකළ යුතුය. පෞද්ගලික භාවිතය සඳහා භාණ්ඩ ආනයනය කිරීමට සිදුකරන

ගෙවීම්, භාණ්ඩ තොගයකට නැව්ගත පිරිවැය රක්ෂණ (C.I.F) පදනමින් නියාමක ආයතනය විසින් කලින් කලට දක්වා ඇති උපරිමයකට සීමා වේ. 'පෞද්ගලික භාවිතය' යන්නෙන් අදහස් වන්නේ කාඩ්පත් හිමියා, ඔහුගේ/ඇයගේ කලත්‍රයා සහ දරුවන් සහ දෙමාපියන්ගේ භාවිතය සඳහා වන අතර, වාණිජ කාර්යයක් සඳහා භාවිත කිරීම ඊට ඇතුළත් නොවේ.

13.3 ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීමක් සිදුවන පරිදි ඉහත දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකාවේ සිට විදේශයකට සිදුකරන ගනුදෙනු සඳහා ද ඇතුළත්ව, කාඩ්පත් හිමියා වෙනුවෙන් ඔහුගේ/ඇයගේ කාඩ්පත භාවිත කිරීම සඳහා කාඩ්පත් හිමියා විසින් වෙනත් කිසිදු පාර්ශ්වයකට අවසර නොදිය යුතුය.

13.4 කාඩ්පත් හිමියා සංක්‍රමණය වන්නේ නම්, විදේශ රටක රැකියාවක් සඳහා ශ්‍රී ලංකාව හැර යන්නේ නම්, හෝ වර්තමානයේ බලාත්මකව ඇති පරිදි සහ කලින් කලට සංශෝධනය කෙරෙන පරිදි විනිමය පාලන පනතෙහි අර්ථනිරූපනයට අනුව 'අනේවාසික' ලෙස සැලකෙන්නේ නම්, කාඩ්පත් හිමියා විසින් කාඩ්පත (කාඩ්පත්) බැංකුව වෙත භාර දිය යුතු වේ.

13.5 විනිමය පාලන පනත, 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, සහ ඊට අදාළ වන මාර්ගෝපදේශ හා නියමයන් ද, 1988 අංක 30 දරන ශ්‍රී ලංකා බැංකු පනත හා එකී සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති හෝ වෙනත් නියාමන ආයතනයක් විසින් කලන් කලට නියම කර ඇති මාර්ගෝපදේශ හා නියමයන් ද ඇතුළත් මාර්ගෝපදේශවල අඩංගු ප්‍රතිපාදනවල දක්වා ඇති විනිමය පාලකවරයාගේ වාර්තා කිරීමේ නියමයන්ට අනුකූලව බැංකුව විසින් ක්‍රියා කරනු ඇත.

13.6 අදාළ අවස්ථාව වනවිට බලාත්මකව පවතින විනිමය පාලන රෙගුලාසි කඩකිරීමක් සිදුව ඇති බවට බැංකුවට විශ්වාස කිරීමට හේතු පවතින්නේ නම්, බැංකුව විසින් ස්වකීය මතයට අනුව කාඩ්පත් හිමියා (හිමියන්) වෙත දැනුම් දීමකින් තොරව කාඩ්පත අවලංගු කළ හැකිය.

13.7 විනිමය පාලන පනතෙහි ප්‍රතිපාදන සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසිවලට අනුකූලව සෑම අවස්ථාවකදීම ඔහු/ඇය විසින් කාඩ්පත භාවිත කරනු ලබන බවට කාඩ්පත් හිමියා වග බලාගත යුතුය.

13.8 කාඩ්පත් හිමියා විසින් වාණිජ ප්‍රමාණවලින් භාණ්ඩ මිලදී ගැනීමට/ ආනයනය කිරීමට සහ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත (කාඩ්පත්) භාවිත නොකළ යුතුය.

## 14. නීතිරීති වෙනස්කිරීම

14.1 නව නීතිරීති සහ කොන්දේසි හඳුන්වා දීම පිණිස, බැංකුව විසින් සුදුසු යැයි සිතන ආකාරයකට කාඩ්පත් හිමියාට දැනුම් දීමක් (බැංකුව විසින් සුදුසු යැයි සිතන ස්ථානයන් හි අදාළ සංශෝධන පළ කිරීම ද ඇතුළත්ව ඊට සීමා නොවී) සිදුකර, කලින් කලට මෙම නීතිරීති හා කොන්දේසි වෙනස් කිරීමට (මේ යටතේ පනවා ඇති ගාස්තු සහ අයකිරීම් සංශෝධනය කිරීම හෝ නව ගාස්තු හා අයකිරීම් හඳුන්වා දීම ද ඇතුළත්ව) බැංකුව විසින් අයිතිය රඳවා ගනියි. එකී දැනුම්දීමෙහි දක්වා ඇති පරිදි එම වෙනස්කිරීම් බලාත්මක වන දිනයෙන් පසුව කාඩ්පත භාවිත කිරීම මගින් කාඩ්පත් හිමියා විසින් කිසිදු කොන්දේසියකින් තොරව එම වෙනස් කිරීම් පිළිගෙන ඇති බවට සැලකෙනු ඇත. කාඩ්පත් හිමියා විසින් අදාළ සංශෝධන පිළිනොගන්නේ නම්, අදාළ වෙනස්කිරීම් බලාත්මක වීමට නියමිත දිනයට පෙර, කාඩ්පත සහ ඒ සමඟ අතිරේක කාඩ්පත (කාඩ්පත්) ද අවලංගු කිරීම පිණිස බැංකුව වෙත භාර දිය යුතු වේ.

14.2 ස්වකීය කාඩ්පත සහ අතිරේක කාඩ්පත (කාඩ්පත්) මගින් සිදුකරන කාඩ්පත් ගනුදෙනු මගින් සිදුවන පාඩු, අයැදීම්, නඩු, නීතිමය ක්‍රියාමාර්ග, ඉල්ලීම්, වන්දි, පිරිවැය සහ වියදම් සඳහා (මෙම ගිවිසුම අවලංගු වීමක් ද නොතකා) බැංකුව වෙත හානිපූරණය කිරීමට කාඩ්පත් හිමියා මෙමගින් අවලංගු කළ නොහැකි ලෙස භාර ගෙන සිටියි.

## 15. තොරතුරු හෙළිදරව් කිරීම

15.1 කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) හෝ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ කාඩ්පත් ගිණුම (ගිණුම්) සම්බන්ධයෙන් බැංකුව විසින් යෝග්‍ය යැයි සැලකෙන පරිදි බැංකුව විසින් පත් කළ තෙවන පාර්ශ්වයන් වෙත, රජයේ ආයතන වෙත සහ/හෝ නියාමක ආයතන වෙත තොරතුරු හෙළිදරව් කිරීමට කාඩ්පත් හිමියා විසින් බැංකුව වෙත අවසර ලබාදෙයි. බැංකුව සමඟ පවතින කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම අවසන් වූ පසුව වුවද මෙම කැමැත්ත ප්‍රකාශ කිරීම බලාත්මකව පවතිනු ඇත.

15.2 කාඩ්පත් හිමියාගේ කාඩ්පත් චර්යාව සම්බන්ධයෙන් පවතින වාර්තා, බැංකුවට එහි අභිමතය පරිදි ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත සහ/හෝ, ජාතික හෝ ජාත්‍යන්තර වෙනත් ණය තොරතුරු කාර්යාංශයක් වෙත වාර්තා කිරීමට හිමිකම පවතින බවට කාඩ්පත් හිමියා මෙමගින් පිළිගෙන, කැමැත්ත පළ කර සිටියි.

## 16. පියවා ගැනීමේ අයිතිය

පියවා ගැනීමට ඇති පොදු අයිතිය හෝ නීතියෙන් හෝ වෙනත් යම් ගිවිසුමක් යටතේ ලබා දී ඇති වෙනත් අයිතීන්ට අතිරේක වශයෙන්, කාඩ්පත් හිමියා සහ/හෝ අමතර/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) බැංකුවෙහි පවත්වාගෙන යන කාඩ්පත් ගිණුමෙහි සහ/හෝ අමතර/ අතිරේක කාඩ්පත් ගිණුමෙහි (ගිණුම්වල) හිඟ ශේෂය වෙනත් ඕනෑම ගිණුමක් (ගිණුම්) සමඟ දැනුම් දීමකින් තොරව සම්බන්ධ කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට සහ, එකී වෙනත් ගිණුමක (ගිණුම්වල) බැර වී පවතින යම් මුදලක් මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා බැංකුව වෙත පවතින වගකීම් තෘප්ත කරගැනීම සඳහා පියවා ගැනීමට යෙදවීමට හෝ ප්‍රේෂණය කිරීමට බැංකුවට හැකි ය.

## 17. මෙම ගිවිසුමෙහි බලපෑම

17.1 මෙම ගිවිසුම අවසන් වුවද ඒ බව නොතකා, සිදුකර ඇති කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් සහ මේ යටතේ කාඩ්පත් හිමියා සහ අමතර/අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වෙත පවතින කිසියම්/ සියලු වගකීම් සම්බන්ධයෙන් මෙහි අඩංගු වන සියලුම ප්‍රතිපාදන කාඩ්පත් හිමියාට එරෙහිව සහ අමතර/අතිරේක කාඩ්පත් හිමියාට (හිමියන්ට) එරෙහිව සම්පූර්ණයෙන් බලාත්මකව සක්‍රීය ව පවතිනු ඇත

17.2 මෙම නීතිරීති හා කොන්දේසි සෑම එකක්ම වෙන් කළ හැකි සහ එකිනෙකින් වෙන් වෙන් ව පවතින අතර, කිසියම් අවස්ථාවක දී මෙම නීතිරීති හා කොන්දේසි අතරින් එකක් හෝ කිහිපයක් අවලංගු වුවහොත්, නීතිවිරෝධී වුවහොත් හෝ බලාත්මක කළ නොහැකි වුවහොත්, ඉතිරි ප්‍රතිපාදනවල වලංගුතාව, නෛතික භාවය හෝ බලාත්මක භාවයට එමගින් කිසිදු බලපෑමක් සිදු නොවනු ඇත.

## 18. නීතිය සහ අධිකරණ බලය

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ පවතින නීති මගින් පාලනය වනු ඇති අතර, ඊට අනුව අර්ථ නිරූපනය කෙරෙනු ඇත.

- බැංකුව විසින් සාධාරණ පරිදි ඉල්ලා සිටින පාරිභෝගික තොරතුරු සැපයීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත් හෝ,
- බැංකුවට පාරිභෝගික තොරතුරු ප්‍රේෂණය කිරීමට හෝ හෙළිදරව් කිරීමට අවශ්‍ය වන මේ යටතේ ලබා දී ඇති යම් කැමැත්ත පළ කිරීමක් කාඩ්පත් හිමියා විසින් රඳවා ගතහොත් හෝ ඉවත් කර ගතහොත් හෝ,

- මූල්‍ය අපරාධයක් සිදුකිරීමේ හැකියාවක් පවතින බවට බැංකුවට සැකයක් පවතින්නේ නම් හෝ කාඩ්පත් හිමියා වෙතින් මූල්‍ය අපරාධයක් සිදුවීමේ අවදානමක් බැංකුව වෙත මතු වන්නේ නම්,

බැංකුව විසින්,

(a) නව සේවාවන් හෝ සේවාවන් සියල්ලම හෝ ඉන් කොටසක් හෝ කාඩ්පත් හිමියා වෙත සැපයීමට නොහැකිවිය හැකි අතර, මෙම කාඩ්පත් ගිවිසුම අවසන් කිරීමට අයිතිය රඳවා ගනියි.

(b) අනුකූලතා බැඳීම් ඉටුකිරීම පිණිස අවශ්‍ය වන පියවර ගත හැකි අතර, සහ/හෝ

(c) ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම අවහිර කිරීම, පැවරීම හෝ වසා දැමීම සිදුකළ හැකිය.

මූල්‍ය අපරාධ අනාවරණය කරගැනීම, පරීක්ෂණ සිදුකිරීම හා වැළැක්වීමට අදාළ වන හෝ ඊට සම්බන්ධ නීති, රෙගුලාසි, සම්බාධක, ජාත්‍යන්තර මාර්ගෝපදේශ, බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි, සහ/හෝ යම් අධිකාරියක නියමයන්වලට අනුකූලව කටයුතු කිරීමට බැංකුව සහ එහි සාමාජිකයන් විසින් (ඔවුන්ගේ තනි සහ පූර්ණ අභිමතය පරිදි) සුදුසු යැයි සැලකෙන ඕනෑම පියවරක් ගැනීමට අවශ්‍ය කෙරේ ('මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග').

(a) කාඩ්පත් හිමියා වෙත හෝ විසින් හෝ ඔහු/ඇය වෙනුවෙන් සිදුකළ උපදෙස්, සන්නිවේදන, මුදල් ආපසු ගැනීමේ ඉල්ලීම්, සේවා සඳහා අයදුම් කිරීම්, හෝ වෙනත් ඕනෑම ගෙවීමක් නිරීක්ෂණය, හසුකර ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම (b) මුදල් ලැබුණු මූලාශ්‍රය පිළිබඳව හෝ අදාළ මුදල් ලබන්නා පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම (c) කාඩ්පත් හිමියා පිළිබඳ තොරතුරු බැංකුව සතුව ඇති වෙනත් අදාළ තොරතුරු සමඟ සම්බන්ධ කිරීම සහ/හෝ (d) සම්බාධකවලට ලක්ව ඇත්දැයි පුද්ගලයෙකුගේ හෝ ආයතනයක තත්ත්වය පිළිබඳව වැඩිදුරටත් විමසීම් සිදුකිරීම හෝ, පාරිභෝගිකයාගේ අනන්‍යතාව හා තත්ත්වය පිළිබඳව තහවුරු කරගැනීම ද එම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වන නමුත් ඊට සීමා නොවේ.

විශේෂයෙන්ම, බැංකුව විසින් සිදුකරන මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග මගින් යම් ගෙවීමක් සිදුකිරීම හෝ නිශ්කාශනය කිරීම, කාඩ්පත් හිමියාගේ උපදෙස් හෝ සේවා අයදුම් කිරීමක් ක්‍රියාත්මක කිරීම, හෝ සේවාවන් සියල්ලම හෝ ඉන් කොටසක් සැපයීම බැංකුව විසින් ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමක්, සිදුවිය හැකිය. නීතියෙන් අවසර ලැබී ඇති ප්‍රමාණයට, මූල්‍ය අපරාධ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් සිදුවන, ඕනෑම ආකාරයකින් පැන නගින, කාඩ්පත් හිමියාට හෝ තෙවන පාර්ශ්වයකට විඳින්නට හෝ දරන්නට සිදුවන පාඩුවක් සම්බන්ධයෙන් බැංකුව හෝ එහි සාමාජිකයන් කාඩ්පත් හිමියා වෙත හෝ වෙනත් තෙවන පාර්ශ්වයක් වෙත වගකීමට යටත් නොවේ.

## 19. බදු අනුකූලතාව

බැංකුව විසින් සපයා ඇති කාඩ්පත හෝ සේවාවන් විවෘත කිරීම හා භාවිතයට අදාළව, අදාළ වගකීම් පැන නගින සියලුම බලප්‍රදේශයන්හි බදු පිළිබඳ බැඳීම් තේරුම්ගැනීම හා ඊට අනුකූලව කටයුතු කිරීම (බදු ගෙවීම සහ අදාළ සියලු බදු ගෙවීවලට සම්බන්ධ වාර්තා හෝ අවශ්‍ය ලේඛන ගොනු කිරීම ) සඳහා කාඩ්පත් හිමියා තනිව වගකිව යුතු බවට කාඩ්පත් හිමියා පිළිගනියි. සම්බන්ධිත තැනැත්තෙකු ලෙස (ඔහුගේ පුද්ගලික තත්ත්වයෙහි නොව) කාඩ්පත් හිමියාගේ තත්ත්වයෙහි කටයුතු කරන සෑම සම්බන්ධිත තැනැත්තෙකුම, තමන් වෙනුවෙන් එම පිළිගැනීම ම සිදුකරයි. සම්බන්ධිත තැනැත්තාගේ හෝ කාඩ්පත් හිමියාගේ වාසය, නේවාසික ස්ථානය, පුරවැසි භාවය හෝ ආයතනික භාවය නොසලකා දේශභූමියෙන් පරිබාහිරව බලයක් සහිත බදු අණපනත් සමහර රටවල පැවතිය හැකිය. බැංකුව විසින් බදු උපදෙස් සපයනු නොලැබේ. ස්වාධීනව නීති සහ බදු උපදෙස් ලබාගන්නා ලෙස කාඩ්පත් හිමියාට මෙමගින් උපදෙස් දෙනු ලැබේ. කාඩ්පත් ගිණුම විවෘත කිරීම හා භාවිතයට හා බැංකුව විසින් සපයන සේවාවන්ට නිශ්චිතවම අදාළ වන පරිදි පැන නගින බැඳීම් ද ඇතුළත්ව, කිසිදු බලප්‍රදේශයක පැනනගින කාඩ්පත් හිමියාගේ බදු පිළිබඳ බැඳීම් සම්බන්ධයෙන් බැංකුවට කිසිදු වගකීමක් නොමැත.

මෙම නීතිරීති සහ පාරිභෝගිකයා හා බැංකුව අතර පවතින වෙනත් සේවාවක්, සැලසුමක්, ව්‍යාපාර සම්බන්ධයක්, ගිණුමක් හෝ ගිවිසුමක් අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවයක් පැවතියහොත්, එවිට මෙම නීතිරීති බලාත්මකව පවතිනු ඇත. ඒ සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා වෙතින් දැනටමත් ලැබී ඇති යම් කැමැත්ත ප්‍රකාශ කිරීමක්, බලය දීමක්, ඉල්ලා ඇති අයිතිය අතහැරීමක් සහ අවසර දීමක් අදාළ දේශීය නීතියෙන් අවසර ඇති ප්‍රමාණයට බලාත්මකව පවතිනු ඇත.

## 20. විවිධ

මෙම නීතිරීතිවල ප්‍රතිපාදන කිසිවක් හෝ සියල්ලම යම් බලප්‍රදේශයක පවතින නීතිය යටතේ කිසියම් ආකාරයකින් නීතිවිරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වුවහොත්, වෙනත් යම් බලප්‍රදේශයක එම ප්‍රතිපාදනවල නෛතික භාවයට, වලංගු භාවයට හෝ බලාත්මක භාවයට හෝ, එම බලප්‍රදේශයේ මෙම නීතිරීතිවල ඉතිරි කොටසට එමගින් බලපෑමක් සිදු නොවනු ඇත.

## 21. ගිවිසුම අවසන් කිරීමෙන් පසුව බලාත්මකව පැවතීම

මෙම නීතිරීති අවසන් කිරීම, සෙලාන් බැංකුව හෝ සෙලාන් බැංකුවේ සාමාජිකයෙකු විසින් කාඩ්පත් හිමියා වෙත යම් සේවාවක් සැපයීම අවසන් කිරීම හෝ, කාඩ්පත් හිමියාගේ ගිණුම් කිසිවක් වසා දැමීම නොතකා අඛණ්ඩව අදාළ වනු ඇත.